PRESS RELEASE

# Lanka SSL හි නිෂ්පාදිත කම්බි වසර 25 කට අධික කාලයක් කල් පවතින බව තහවුරු වෙයි.

E. B. Creasy සමූහය අනුබද්ධිත මෙරට ගැල්වනයිස් කම්බි නිෂ්පාදනයේ පුරෝගාමී සමාගමක් වන Lanka Special Steel Limited (Lanka SSL) සමාගම මොරටුව විශ්වවිද්‍යාලයේ ද්‍රව්‍ය විද්‍යා සහ ඉංජිනේරු අධ්‍යයනාංශය සමග මාස 14ක පර්යේෂණ සහයෝගිතාවකට එළඹියේය.

එම පර්යේෂණයේ ක්ෂේත්‍ර සහ විද්‍යාගාර පරීක්ෂණය දත්ත අනුව Lanka SSL සමාගම විසින් නිෂ්පාදනය කරනු ලබන ගැල්වනයිස් කම්බි වසර 25කට අධික කාලයක් කල් පවතින බව තහවුරු විය. මෙරට විවිධ ප්‍රදේශවල විඛාදන අනුපාත සැලකිල්ලට ගනිමින් මෙම පර්යේසණ සිදු කෙරුණු අතර එම සමාගමේ නිෂ්පාදන විශිෂ්ටත්වය සහ විශ්වාසනීයත්වය මෙමගින් තවදුරටත් තහවුරු විය.

ISO 9001: 2015 සහ SLS 139:2003 තත්ත්වය සහතිකවලින් පිදුම් ලබා ඇති Lanka SSL සමාගම ගැල්වනයිස් කම්බි වසරකට මෙට්‍රික් ටොන් 12,500ක් නිෂ්පාදනය කරයි. පසුගිය දශක දෙකක කාලයක් පුරා කීර්තිමත් ගැල්වනයිස් වානේ කම්බි නිෂ්පාදන, නිෂ්පාදකයන්ගේ පළමු තේරීම බවට පත්ව ඇති Lanka SSL සමාගම මෙරට වෙළඳපල තුළ 80%ක වෙළඳපල හිමිකාරිත්වයක් දරයි.

“මොරටුව විශ්වවිද්‍යාලය සමග සිදු කළ පර්යේෂණයේ ප්‍රතිඵල පිළිබඳ අප බෙහෙවින් සතුටු වනවා. අපගේ නිෂ්පාදන ක්‍රියාවලිය තුළ උසස් ම ප්‍රමිතිය පවත්වා ගැනීම සඳහා අප දක්වන කැපවීම මෙමගින් තවදුරටත් පිළිබිඹු වනවා. අපගේ ලෙන්ගතු සේවාලාභී පදනම අප ගොඩනගා ගෙන ඇති කීර්තිමත් නාමයට සාක්ෂ්‍ය දරන අතර ඉදිරියේදී තව තවත් විශිෂ්ටත්වය වෙනුවෙන් අප කැපවනවා” යනුවෙන් Lanka SSL සමාගමේ ප්‍රධාන විධායක නිළධාරී ප්‍රවීන් ද සිල්වා මහතා සඳහන් කළේය.

මොරටුව විශ්වවිද්‍යාලයේ පර්යේසණ කණ්ඩායම වෙනුවෙන් අදහස් පළ කළ ආචාර්ය එස්.යූ. අධිකාරි මහතා සඳහන් කළේ, විවිධ ගැල්වනයිස් කම්බි නිෂ්පාදන මෙරට විවිධ විඛාදන ශ්‍රේණි වලට අයත් ප්‍රදේශවල පරිසර තත්ත්ව යටතේ එම මාස 14ක කාලය පුරා පරීක්ෂාවට ලක් කළ බවය. “කාර්මික කලාපය, තෙත් සහ වියළි කලාපය, වෙරළ තීරය සහම මධ්‍යම ප්‍රදේශය තුළ අප පර්යේෂණ දියත් කළ අතර එම එක් එක් ප්‍රදේශය තුළ විඛාදනය මැනීම සඳහා පර්යේෂණ කණ්ඩායම විඛාදන මොඩලයක් ද ගොඩනැගුවා. එම පර්යේෂණයේ දත්ත අනුව GI කම්බි වසර 25කට අධික සේවා කාලයකට හිමිකම් කියන බව විද්‍යාත්මකව තහවුරු වුණා”

For follow-up or verifications, please contact Thanzyl Thajudeen
Mark and Comm Ltd | Public Affairs
A: Colombo, Sri Lanka |T: +94 112714204| M: +94 777 779164 | E:thanzyl@markandcomm.com

PRESS RELEASE

කටු කම්බි, PVC කම්බි, දැල්, GI කම්බි දැල්, ගැබියන් සහ කේබල් ආදී නිෂ්පාදන රැසක් Lanka SSL වානේ කම්බි මගින් නිෂ්පාදනය වී වෙළඳපොළට ඉදිරිපත් වේ.

ඉදිරිගාමී දැක්මකින් යුතු නායකත්වය සමගින් ක්‍රමෝපායික සැලසුමකින් යුතුව සාර්ථකත්වය කරා ගමන් කරන Lanka SSL සමාගම මානව සම්පත සහ නිෂ්පාදන කෙරෙහි සිය ප්‍රමුඛ අවධානය යොමු කර ඇත. පර්යේෂණ සහ සංවර්ධන ක්‍රමෝපායික සැලසුම් ක්‍රියාකාරි ලෙස දියත් කරන එම සමාගම ඒ හරහා සිය නිෂ්පාදන සහ සේවා අසමසම ප්‍රමිතියෙන් යුතුව පාරිභෝගිකයන් හට පිරිනැමීමට කටයුතු කරයි. 2018 වසරේ ජාතික ව්‍යාපාර විශිෂ්ටතා සම්මාන උළෙලේදී එම සමාගම 'නිෂ්පාදන-වෙනත්' කාණ්ඩය යටතේ ජයග්‍රහණය හිමිකර ගත් අතර එම සම්මාන උළෙලේ පරිමාණ කාණ්ඩයේ දෙවන ස්ථානය හිමි කර ගැනීමට සමත් විය.

For follow-up or verifications, please contact Thanzyl Thajudeen
Mark and Comm Ltd | Public Affairs
A: Colombo, Sri Lanka |T: +94 112714204| M: +94 777 779164 | E:thanzyl@markandcomm.com